

# ඇෆ්ගනිස්ථානයට සාමය උදාවේද?

සාම සාකච්ඡා සඳහා ඇමරිකාව කළ ආරාධනය ඇෆ්ගනිස්ථාන තලේබාන් සංවිධානය පිළිගෙන තිබේ. ඒ බව ඇමරිකාව ප්‍රකාශ කළේ ජුනි මස තෙවන සතියේදීය. තලේබාන් සංවිධානයද එය පිළිගනිමින් නිවේදනයක් නිකුත් කර තිබුණි. ඒ සමඟ දොළොස් වසරක් තිස්සේ ඇෆ්ගනිස්ථානයේ ජන ජීවිතය උඩුයටිකුරු කරමින් සිදුවන අවි ගැටුම් නිමාවනු ඇති බවට ඇතැම් දේශපාලන විචාරකයෝ පවසා තිබුණි.

ඇෆ්ගනිස්ථානය ඉස්ලාම් අන්තවාදී සංවිධානයක් වන තලේබාන් සංවිධානයේ අන්තවාදීන්ගේ පාලනයට යටත් වූයේ 1996 වසරේදීය. එතැන් සිට ඇෆ්ගනිස්ථානය තුළ සිදුවන අන්තවාදී ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් ජාත්‍යන්තර වශයෙන් දැඩි දෝෂ දර්ශනයට ලක් විය. විශේෂයෙන්ම ලෝකයේ ඉස්ලාම් අන්තවාදී සහ ත්‍රස්තවාදී සංවිධානවලට ප්‍රබල ලෙස ආධාර අනුබල සහ රැකවරණ සැළසීම ඇෆ්ගනිස්ථානයෙන් සිදුවන බවට චෝදනා එල්ල විය. එහෙත් ඇෆ්ගන් තලේබාන් පාලකයෝ ජාත්‍යන්තරයේ විවේචන නොතකා සිය කටයුතු නොවෙනස්ව දිගටම සිදුකරගෙන ගියහ.

එලෙස ගෙන ගිය අන්තවාදී තලේබාන් පාලනයේ අවසානය සිදුවූයේ අනපේක්ෂිත

**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

අයුරිනි. ඒ ඇමරිකාව ප්‍රමුඛව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ රටවල් ඒකාබද්ධව ඇෆ්ගනිස්ථානයට ප්‍රහාර එල්ල කරන්නට පටන් ගැනීමත් සමඟය. ඊට මග පෑදුනේ 2001 වසරේ සැප්තැම්බර් 11 වන දින ඇමරිකාවේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයට අල්-ක්වයිදා සංවිධානයෙන් එල්ල වූ මරාගෙන මැරෙන ප්‍රහාරයයි. මේ ප්‍රහාරයෙන් පන්දහ-

> ***ඔහු පවසන්නේ තලේබාන් පාලන සමයේ ඇෆ්ගනිස්ථානය හැඳින්වීමට යොදාගත් නම තබන ලද සාම කාර්යාලය ඇමරිකාව පිළිගැනීම නොකළ යුතුව තිබූ දෙයක් බවය. ඒ පිළිබඳ සිය බලවත් විරෝධය පළකරන කර්සායි ඇමරිකාව සමඟ පවත්වන ආරක්ෂක සාකච්ඡා නතර කර දැමීමටද කටයුතු කළේය.***

සකට ආසන්න පිරිසක් මියගිය අතර ඩොලර් බිලියන ගණනක මුල්‍ය අලාභයක් විඳීමටද ඇමරිකාවට සිදුවිය. අල්-ක්වයිදා සංවිධානයේ නායක ඔසාමා බින් ලාඩන් සොයා නේටෝ හමුදා ඇෆ්ගනිස්ථානයට කඩාවදින්නේ මේ ප්‍රහාරයෙන් පසුවය. කෙටි කාලයක් තුළ ඇෆ්ගනිස්ථානයේ පැවැති තලේබාන් පාලනය අවසන් කිරීමට නේටෝ හමුදා සමත්වුවද රට සාමාන්‍ය තත්ත්වයට ගෙන ඒම ඒ ආකාරයේ පහසු කටයුත්තක් වූයේ නැත. ඒ සඳහා වෙනස් වූ වැඩසටහන් ක්‍රියාවට නගන්නට නේටෝවට සිදුවිය.

එක් අතකින් රටේ ආරක්ෂාව තහවුරු කරමින් අනෙක් අතින් රට තුළ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවත්වාගෙන යාහැකි පසුබිමක් නිර්මාණය කරන්නට එහිදී ඇමරිකාවට සිදුවිය. ඒ වෙනුවෙන් ඇමරිකානුවන්ට ''ගෙවන්නට සිදුවූ මිල'' ඉතා ඉහළය. කෙසේ හෝ ඒ ''වැය'' දරාගෙන ඇමරිකාව සිය මෙහෙයුම ඉදිරියට ගෙන ගියේය. නිරන්තරයෙන් එල්ලවන තලේබාන් සංවිධානයේ ගරිල්ලා ප්‍රහාරවලට මුහුණ දෙමින්




ඇෆ්ගනිස්ථානයේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ස්ථාපිත කරන්නට අවසානයේදි ඇමරිකාව සමත් විය. ඇමරිකාවට අවශ්‍ය ලෙසින් ක්‍රියාත්මක වන ඒ පාලනයේ ස්වදේශීය නියමුවා බවට පත්වූයේ මොහමඩ් කර්සායිය. කර්සායිගේ පාලනය පිළිගැනීමට තලේබාන් සංවිධානය සූදානම් නොවීය. එහෙයින් එයට එරෙහිව නොනවතින යුද්ධයක් පවත්වාගෙන යන්නට තලේබාන් සංවිධානය ක්‍රියා කළේය. එබැවින් කර්සායිගේ පාලනය පවත්වා ගැනීමට අවශ්‍ය සන්නද්ධ සහාය තවදුරටත් ලබාදෙන්නට ඇමරිකාව ප්‍රමුඛ නේටෝවට සිදුවිය.

මේ ගැටුම් නවත්වා ඇෆ්ගනිස්ථානයට සාමය උදාකිරීමට කර්සායි විවිධ ප්‍රයත්නයන් දැරුවද ඒ කිසිවක් සාර්ථක වූයේ නැත. කර්සායි ඒ වෙනුවෙන් සාම මණ්ඩලයක් පවා පිහිටුවනු ලැබුවේය. තලේබාන් සංවිධානයත් සමඟ සංහිඳියාවකට ඒමට ඇමරිකාවට අවශ්‍ය වන්නේ ඉන් බොහෝ කලකට පසුවය.

ඇමරිකාව අපේක්ෂා කළ පරිදි අල්-ක්වයිදා නායක ඔසාමා බින් ලාඩන් ඇෆ්ගනිස්ථානයේ නොසිටීමත්, තමන්ට අවශ්‍ය ආකාරයේ පාලනයක් ඇෆ්ගනිස්ථානයේ ස්ථාපිත කිරීමට සමත්වීමත් හේතුවෙන් තවදුරටත් ඇෆ්ගනිස්ථානය තුළ ඇමරිකාවට කරන්නට කාර්යභාරයක් ඉතුරු වූයේ නැත. රටේ ආරක්ෂාව ඇෆ්ගනිස්ථාන ආරක්ෂක අංශවෙතම පවරා සිය හමුදා ඉවත් කරගැනීමට නේටෝවට අවශ්‍ය විය.

නේටෝව ඒ සඳහා සකස් කළ කාල සටහන් අනුව ලබන වසර අවසන්වීමට පෙර නේටෝ හමුදා සම්පූර්ණයෙන්ම ඇෆ්ගනිස්ථානයෙන් ඉවත් කළ යුතුය. එහෙත් ඉන් පසු රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීමට ඇෆ්ගන් ආරක්ෂක අංශ සමත්වනු ඇත්ද යන්න අවිනිශ්චිතය. තලේබාන් පාලනය පෙරලා දමා වසර දොළහක් ගතවී ඇතත් මේ වන විටත් ඇෆ්ගනිස්ථානය බලවත් ආකාරයෙන් තලේබාන් ත්‍රස්තවාදයට මුහුණ පා සිටින්නේය. තලේබාන් ප්‍රහාර හේතුවෙන් නිරන්තරයෙන්ම ජීවිත සහ දේපොළ හානි සිදුවේ. මෙවැනි පසුබිමක නේටෝවට නිහඬවම සිය හමුදා ඇෆ්ගනිස්ථානයෙන් ඉවත් කරගෙන යාමේ ගැටළුවක් පවතී. ඇමරිකාව තලේබාන් සංවිධානයට සාකච්ඡා සඳහා ආරාධනා කරන්නේ ඒ ගැටළුවට විසඳුම් සෙවීමටය.

තලේබාන් සංවිධානය ඇමරිකාවේ මේ ආරාධනය පිළිගනිමින් ඉකුත් මාසයේ සාම කාර්යාලයක්ද පිහිටුවනු ලැබීය. එය ස්ථාපිත කළේ කටාර් රාජ්‍යයේය. එම කාර්යාලය නම් කළේ ''ඇෆ්ගන් එමීර් රාජ්‍යය'' යනුවෙනි. එය සංකේතාත්මක වැදගත්කමක් ඇති නාමයකි. 1996 වසරේ සිට 2001 වසර දක්වා ඇෆ්ගනිස්ථානයේ පැවැති තලේබාන් පාලනය යටතේ ඇෆ්ගනිස්ථාන හඳුන්වනු ලැබුවේ ''ඇෆ්ගන් එමීර් රාජ්‍ය'' යනුවෙනි. ඒ නාමය තම සාම කාර්යාලයට තැබීමෙන් තලේබාන් සංවිධානයේ යටි අරමුණු පිළිබඳ ඉඟිකර තබුණද ඇමරිකාව එය නොතකා සාම කාර්යාලය පිළිගත්තේය. ඉදිරියට ගත හැකි සාම වැඩපිළිවෙළක් සම්බන්ධයෙන් එය හා අදහස් හුවමාරු කරගැනීමද ඇරඹීය. එලෙස ඇමරිකාවත් තලේබාන් සංවිධානයත් අතර සාම කතාබහක් සිදුවෙමින් පවතින අතර සාම කාර්යාලයේ නම මුල්කරගනිමින් ඇෆ්ගන් ජනාධිපති කර්සායි ඇමරිකාව සමඟ අරෝවකට පැටළී සිටියි.

ඔහු පවසන්නේ තලේබාන් පාලන සමයේ ඇෆ්ගනිස්ථානය හැඳින්වීමට යොදාගත් නම තබන ලද සාම කාර්යාලය ඇමරිකාව පිළිගැනීම නොකළ යුතුව තිබූ දෙයක් බවය. ඒ පිළිබඳ සිය බලවත් විරෝධය පළකරන කර්සායි ඇමරිකාව සමඟ පවත්වන ආරක්ෂක සාකච්ඡා නතර කර දැමීමටද කටයුතු කළේය. තලේබාන් සංවිධානයද කටාර් සිට ඇමරිකාව සමඟ සාම සාකච්ඡා සිදුකරන අතර ඇෆ්ගනිස්ථානයේ නේටෝ හමුදා ඉලක්ක කර සිදුකරන ප්‍රහාර නතර කොට නැත. ජූලි මස 2දා අළුයම කාබුල් අගනුවර නේටෝ කඳවුරකට තලේබාන් ප්‍රහාරකයෝ එල්ල කළ ප්‍රහාරයකින් සෙබළුන් තිදෙනෙකු ඇතුළු පස්දෙනෙකු ජීවිතක්ෂයට පත්ව දස දෙනෙකු තුවාල ලැබූහ. මේ සිදුවීම් සිදුවන්නේ ඇමරිකාව සහ තලේබාන් සංවිධානය සාම වැඩපිළිවෙළක් සකස් කිරීමට සූදානම් වෙමින් සිටින තීරණාත්මක අවස්ථාවකය. එබැවින් ඇෆ්ගනිස්ථානයේ දිගුකාලීන සාමය සඳහා තබා ඇති බලාපොරොත්තු ඒ ආකා-ාරයෙන්ම සඵල වනු ඇත්ද යන්න අවිනිශ්තය.

## දිනපොත

## 2013 ජුනි

8. දකුණු අප්‍රිකාවේ හිටපු ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා අසාද්‍ය තත්ත්වයෙන් රෝහල් ගත කෙරේ.

14. ඉරාන ජනාධිපතිවරණය පැවැත්වේ. 50.7%ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගනිමින් මධ්‍යස්ථ මතධාරී ඉස්ලාම් ආගමික නායකයකු වන හසන් රොහානි ජයහිමිකර ගනියි.

15. පාකිස්ථානයේ බලුකිස්ථාන ප්‍රාන්තයේ ක්වෙටා නගරයේ පිහිටි මහ රෝහලකට තලේබාන් සටන්කරුවන් දස දෙනෙකු කඩා වැදී එල්ල කළ ප්‍රහාරයකින් රෝගීන් සහ රෝහල් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ද ඇතුළුව 22දෙදෙනෙකු ජීවිතක්ෂයට පත්ව 35 දෙනෙකු තුවාල ලබයි.

17. ලෝකයේ බලවත් ආර්ථිකයකට හිමිකම් කියන රටවල් වාර්ෂිකව පවත්වන ''ඨ 8'' සමුළුව දැඩි ආරක්ෂාව මධ්‍යයේ අයර්ලන්තයේ එනිස්කිලන් නුවරදී ඇරඹේ.

20. සෝමාලියාවේ මොගඩිෂු අගනුවර පිහිටි එක්සත් ජාතීන්ගේ සංවර්ධන කාර්යාලයකට එල්ල වූ ප්‍රහාරයකින් 21 දෙනෙකු ජීවිතක්ෂයට පත්ව 15 දෙනෙකු තුවාල ලබයි. ප්‍රහාරය ඉස්ලාමීය අන්තවාදී කණ්ඩායමක ක්‍රියාවක් බව සෝමාලියා රජය පවසයි.

24. ඉන්දියාවේ ගංගා නදිය පිටාර ගැලීමෙන් මියගිය පුද්ගලයන් දහසකගේ මළ සිරුරු සොයා ගත් බව එරට මාධ්‍ය වාර්තා කරයි.

25. ඇෆ්ගනිස්ථාන ජනාධිපති මන්දිරයට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරයකින් ජනාධිපති හමීඩ් කර්සායි දිවි බේරා ගනී. සාමාන්‍ය වැසියන් සේ වෙස්වලාගත් තලේබාන් සටන්කරුවන් සිව්දෙනෙක් මුර කපොළුවලින් රිංගා ජනාධිපති මන්දිරයේ නැගෙනහිර දොරටුව වෙත පැමිණ ප්‍රහාරය එල්ල කර ඇති අතර ප්‍රහාරය මැඩපැවැත්වීමට පැය දෙකක පමණ කාලයක් ගතවූ බව ඇෆ්ගන් මාධ්‍ය වාර්තා කරයි.

30. ඊජිප්තු ජනාධිපති මොහමඩ් මෝර්සිගේ නව දේශපාලන ප්‍රතිසංස්කරණ යෝජනාවලට එරෙහිව විරෝධතා දක්වන ජනතාව ජනපති මෝර්සිගේ ''මුස්ලිම් සහෝදරත්වය'' පක්ෂ මූලස්ථානය ගිනි තබා වනසා දමති.

**DELIVERY DRIVERS NEED**

Courier drivers need for permanent runs start from Port Melbourne at 6.30am and finished around 4.00pm in Port Melbourne. Vans provided and immediately start. Guaranteed good income per week.

**Call Sam on 0414245870**

Send your resume to dandytransport@yahoo.com.au